සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය - 2020

--------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව.

- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.

- මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 713,251 ක හිඟයක් වූ අතර, පූර්ව වර්ෂයේ එයට අනුරූප හිඟය රු. 750,687 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 37,436 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා හේතු වූයේ පුද්ගල පඩිනඩි හා අනෙකුත් මෙහෙයුම් වියදම් අඩු වීමයි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ව්‍යාපෘතිවල හෝ ප්‍රාග්ධන කටයුතුවල ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණනයට සපයා ඇති ක්‍රියාකාරී සැලැස්මට අනුව, 2020 වසර අවසානය වන විට නිම කිරීමට නියමිත ක්‍රියාකාරකම් වන, සේවාදායක මෙහෙයුම් සඳහා ආපදා ප්‍රතිසාධන කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතිය (SRIS) ස්ථාපනය කිරීම සහ සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතිය (SRIS) මගින් දැනුම හුවමාරු කිරීමේ සැසියක් පැවැත්වීම, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතියේ (SRIS) අභ්‍යන්තර පාර්ශවකරුවන් සඳහා තොරතුරු තාක්ෂණ සහ ආරක්ෂක ප්‍රතිපත්තියක් හඳුන්වාදීම, පූර්ණ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා සමීක්ෂණ පැවැත්වීම, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතිය (SRIS) සඳහා තොරතුරු තාක්ෂණ විගණනය සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු වෙමින් පවතී, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතිය (SRIS) ට සම්බන්ධ අදාළ බලධාරීන් සමඟ විධිමත් දෘඩාංගයක් සහ වාර්තා බෙදාහැරීමේ ක්‍රියා පටිපාටියක් සංවර්ධනය කිරීම, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතියේ (SRIS) සජීවී ක්‍රියාකාරිත්වයට සහාය වීම සඳහා සංවිධාන ව්‍යුහය ප්‍රතිව්‍යුහගත | සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධති (SRIS) නඩත්තු ලේඛනය මුදල් අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අනුමැතිය අපේක්ෂා කරන්නෙමු. සමාජ ආරක්ෂණ දැල් ව්‍යාපෘතිය (SSNP) මගින් දැනටමත් දත්ත සත්‍යාපන යෙදුම සංවර්ධනය කිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇත. එමෙන්ම, පුහුණු ක්‍රියාවලිය ද සිදුවෙමින් පවතී. Covid - 19 වසංගත තත්ත්වය මගින් පැන නගින අවිනිශ්චිතතාවය හේතුවෙන් කාලරාමුව පිළිබඳ ඉලක්කය සපුරාලීම අභියෝගාත්මක විය හැකිය. | සුබසාධන ප්‍රතිලාභ මණ්ඩල පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය. |

කිරීම සහ විධිමත් සන්නිවේදන පද්ධතියක් ස්ථාපනය කිරීම යනාදි ක්‍රියාකාරකම් සැලැස්මට අනුව සම්පූර්ණ කර නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත සේවක සංඛ්‍යාව වූ 18 හා සසඳන විට 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සත්‍ය සේවක සංඛ්‍යාව 09 ක් විය. එබැවින්, සභාපති තනතුර ඇතුළුව තනතුරු 09 ක් පුරප්පාඩුව පැවති අතර සියලුම සේවකයන් වැඩබලන, ද්විතීයන පදනමින් සහ තාවකාලික පදනමින් බඳවාගෙන තිබුණි. එමෙන්ම, මණ්ඩලය 2016 වර්ෂයේදී ස්ථාපනය කර තිබුණ ද, 2020 දෙසැම්බර් 31 දින දක්වාම නිසි බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | සේවක සංඛ්‍යාව අනුමත කිරීම් සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම්වරයා සමඟ සාකච්ඡා පවත්වා තිබුණි. තවද, 2020 වර්ෂයේ දී ඉහත කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී. මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ හැකියාව පිළිබඳව ඔවුන් විසින් තීරණය කරනු ඇත. | අදාළ නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |